# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2306/12 - 2022 නොවැම්බර් මස 14 වැනි සඳුදා - 2022.11.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

2022.07.22 දිනැති අංක 2289/43 *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් අතිගරු ජනාධිපතිතුමා විසින් මා වෙත පවරා ඇති පහත උපලේඛනයේ දක්වා ඇති රාජකාරි හා කාර්යන්, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45(5) වැනි වගන්තිය මගින් ධීවර අමාත්‍යවරයා ලෙස මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මා විසින් රාජ්‍ය අමාත්‍යවරයා වෙත පවරා දෙනු ලැබේ.

ඩග්ලස් දේවානන්දා (පා.ම.),
ධීවර අමාත්‍ය.

2022 නොවැම්බර් මස 11 වැනි දින,
ධීවර අමාත්‍යාංශය,
කොළඹ දී ය.


1A - G 38052 — 08 (2022/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති හා අණපනත්* |
| 1. රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා ධීවර විෂයයට සහ 11 වැනි තීරුවෙහි දැක්වෙන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් හා ඇගයීම<br><br>2. අමාත්‍යාංශයේ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම.<br><br>3. නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්ය භාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලු ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම.<br><br>4. ධීවර අංශයේ පර්යේෂණ කටයුතු පුළුල් කිරීම තුළින් මත්ස්‍ය වගාවන් පුළුල් කිරීම.<br><br>5. නවීන විද්‍යාත්මක ක්‍රමවේද ඇසුරින් සාගර සම්පත් ආශ්‍රිත ආර්ථික සංවර්ධනය සඳහා අදාළ ව්‍යාපෘති පුළුල් කිරීමට පහසුකම් සැපයීම.<br><br>6. පාරිභෝගිකයාට සහ නිෂ්පාදකයාට සාධාරණයක් ඉටුවන ආකාරයට මත්ස්‍ය නිෂ්පාදන සඳහා අලෙවි කටයුතු පුළුල් කිරීම. | 1. ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය<br><br>2. ලංකා ධීවර සංස්ථාව<br><br>3. සීමාසහිත සීනෝර් පදනම<br><br>4. නෝර්ත්සී ලිමිටඩ් | • ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය පනත (1981 අංක 54) |

EOG 11 - 0136

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.